Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01.

I. සේවා ගණය හා තනතුරු නාමය : ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය - සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය

II. පුරප්පාඩු සංඛ්‍යාව - 04

III. වැටුප් පරිමාණය හා කේත අංකය - PL 1-2016 - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (2016 වැටුපු පරිවර්තනයන්ට අදාළව 2019 වර්ෂයට හිමි ආරම්භක වැටුප රු. 21,746.00)

IV. අධ්‍යාපන සුදුසුකම් - 8 වන ශ්‍රේණිය (9 වසර සමත් වී තිබිය යුතුය.)

V. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

VI. පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

02.

I. සේවා ගණය හා තනතුරු නාමය - ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය

II. පුරප්පාඩු සංඛ්‍යාව - 03

III. වැටුප් පරිමාණය හා කේත අංකය - PL 1-2016 - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (2016 වැටුප් පරිවර්තනයන්ට අදාළව 2019 වර්ෂයට හිමි ආරම්භක වැටුප - රු. 21,746.00)

IV. අධ්‍යාපන සුදුසුකම් - 8 වන ශ්‍රේණිය (9 වසර සමත් වී තිබිය යුතුය.)

V. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

VI. පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

03.

I. සේවා ගණය හා තනතුරු නාමය - ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය කාර්යාල සේවක සේවයේ කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය

II. පුරප්පාඩු සංඛ්‍යාව - 02

III. වැටුප් පරිමාණය හා කේත අංකය - PL 1-2016 - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (2016 වැටුප් පරිවර්තනයන්ට අදාළව 2019 වර්ෂයට හිමි ආරම්භක වැටුප රු. 21,746.00)

IV. *අධ්‍යාපන සුදුසුකම්* .- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.)

බඳවා ගැනීමේදී අ.පො.ස. (සා/පෙළ) සමතුන් නොමැති වුවහොත් 8 ශ්‍රේණිය සමතුන් බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

V. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

VI. පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

04. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2019.05.10 වැනි දිනට වයස අවු. 18ට නොඅඩු අවු. 45ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
6. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු නොලැබූ අයෙකු විය යුතුය.

7. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

8. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

9. මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

05. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් (එම පිටපත් තමා විසින්ම සත්‍ය පිටපත් බවට අත්සන් තබා තිබිය යුතුය.) අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

- උප්පැන්න සහතිකය;
- අධ්‍යාපන සහතික;
- තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම් සනාථ කෙරෙන ග්‍රාම නිලධාරී සහතිකය;
- මෑතක දී ලබා ගත් චරිත සහතික (02) ක්;
- වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික'

06. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2019.05.10 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

එන්. එන්. ඉද්දගොඩ,
ලේකම්,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 05 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

***........................තනතුර සඳහා අයදුම් පත්‍රය***

1. අයදුම්කරුගේ නම මුලකුරු සහිතව :————————————————————
2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————————————
3. තැපැල් ලිපිනය :————————————————————
4. දුරකථන අංකය :————————————————————
5. උපන් දිනය :
2019.05.10 දිනට වයස ඃ අවු. ඃ...........................මාස ඃ...........................දින ඃ........................
6. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————————
7. ජාතිය :————————————————
8. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ?:————————————————
පරම්පරාවෙන් ද ?/ලියාපදිංචියෙන් ද යන වග :————————————————
9. අධ්‍යාපන සුදුසකම් (සහතිකවල ඡායා පිටපත් අමුණන්න.) :————————————————
10. ඔබ දැනටමත් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් දරන තනතුර :————————————
සේවා කාලය ඃ......................... , එම පත්වීම ස්ථිර/තාවකාලික/අනියම් ද යන වග:————————————————
11. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————————————

ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ *ගැසට් පත්‍රයේ* සඳහන් සියලු කොන්දේසි සපුරා ඇති බවට හා මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

______________________,

අයදුම්කරුගේ අත්සන.

දිනය :______________________.

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය)

මෙහි ඉල්ලුම්කරු වන ........................................ මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත) ........................................දින සිට ........................................කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම් කරන තනතුර සඳහා තෝරගනු ලැබුවහොත්, මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි.

______________________________,

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :____________________________

තනතුර :____________________________

දෙපාර්තමේන්තුව :____________________________

(නිල මුද්‍රාව තබන්න)

දිනය :____________________________